ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>වතුකර ප්‍රදේශවල පාසල් සඳහා ක්‍රියාත්මක වූ STEM ගුරු පුහුණු වැඩසටහන සාර්ථකව අවසන් වේ</u>

ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශවල පාසල් සඳහා ඉන්දියානු රජයේ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වූ ත්‍රෛමාසික ගුරු පුහුණු වැඩසටහනෙහි සමාප්ති උත්සවය 2024 ඔක්තෝබර් 18 වන දින පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වතු සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ දී පැවැත්විණ.

2. මෙම උත්සවය සඳහා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා, අධ්‍යාපන සහ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය සහ පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වතු සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී වූහ.

3. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමක් අනුව නිර්මාණය කරන ලද මෙම වැඩසටහනේ අරමුණ වූයේ වතුකර ප්‍රදේශවල ගුරුවරුන් සඳහා STEM විෂයන් එනම් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි සහ ජීව විද්‍යාව යන විෂයන් සම්බන්ධයෙන් පුහුණුව ලබා දීමයි. ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සපිරීම නිමිත්තෙන් පසුගිය වසරේදී ඉන්දීය රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඉන්දියානු රුපියල් මිලියන 750ක ප්‍රදාන පැකේජය යටතේ මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

4. මෙම වැඩසටහන යටතේ STEM විෂයන් සම්බන්ධයෙන් පුහුණුව ලබාදීමේ ප්‍රවීණත්වය ඇති ඉන්දීය ගුරුවරුන් 19 දෙනෙක් 2024 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියහ. ජාතික අධ්‍යාපන ආයතනය විසින් සංවිධානය කරන ලද මූලික වැඩසටහනෙන් අනතුරුව මෙම ගුරුවරුන් සිය ගුරු පුහුණු වැඩසටහන ඇරඹීම සඳහා වතුකර ප්‍රදේශවල පාසල් වෙත යොමු කරන ලදී. මධ්‍යම, ඌව, සබරගමුව සහ බස්නාහිර පළාත්වල 40කට ආසන්න මධ්‍යස්ථාන ගණනක සති 10ක් පුරා පැවති වැඩසටහන තුළදී ඉන්දීය ගුරු පුහුණු උපදේශකවරුන් විසින් ලබා දුන් පුහුණුවෙන් ශ්‍රී ලාංකික ගුරුවරුන් 2000කට අධික සංඛ්‍යාවක් ප්‍රතිලාභ ලබා ගත්හ.

6. 2024 පෙබරවාරි මස පැවති සමාප්ති උත්සවයේදී අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය සඳහන් කළේ වැඩසටහන ඉතා ඵලදායිව පැවති බව සහ එය පුහුණුව ලබා ගත් ගුරුවරුන්ට සහ සිසුන්ට ඉතා ප්‍රයෝජනවත් වූ බවයි. මෙම වැඩසටහන නුදුරු අනාගතයේදීම නැවතත් පවත්වන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ. එතුමිය

මමෙ මුලපිරීම සම්බන්ධයනේ ඉන්දීය රජයට ස්තුතිය පළ කළාය. මමෙ වැඩසටහනේදී ඉන්දීය ගුරු පුහුණු උපදේශකයන් 19 දනොට විශේෂ උපහාරයක් පුද කරන ලදී.

7. මමෙ අවස්ථාව අමතමින් ඉන්දීය මහ කොමසාරිස්තුමා ගුරු පුහුණු වැඩසටහන සාර්ථකව පැවැත්වීම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව විසින් බදො ගන්නා සුවිශේෂී බැඳීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දායක වන තවත් මුලපිරීමක් බව සඳහන් කළේය. මමෙ වැඩසටහන ශ්‍රී ලංකා ජනතාවගේ අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන් මත පදනම්ව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන සහයෝගිතා මුලපිරීම් රැස අතරින් එකක් බව එතුමා සඳහන් කළේය. මමෙ වැඩසටහන් ජනතාවගේ එදිනදෙ ජීවිතයට සුබවාදී බලපෑමක් මතු කරමින් අධ්‍යාපනය, නිවාස, සෞඛ්‍ය, කෘෂිකර්මය, ජීවනෝපාය මාර්ග, දමෙුහුන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන්, වරාය, දුම්රිය සහ ආගමික ස්ථාන සඳහා සූර්ය බල විදුලිය ලබා දීම වැනි ක්ෂේත්‍ර රැසක් ආවරණය කරමින් දිවයින පුරා ක්‍රියාවට නැංවේ.

***

***කොළඹ***
***2024 ඔක්තෝබර් 20***